www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: ජවිපෙ ශිෂ්‍ය නායකයා සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ව්‍යාපාරයේ විශ්වවිද්‍යාල කන්ඩායමට කායික තර්ජන එල්ල කරයි

## Sri Lanka: JVP student leader physically threatens ISSE campus team

**අපේ වාර්තාකරුවන් විසිනි**

**2007 අගෝස්තු 9**

ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සාමාජිකයෝ, කායික ප්‍රහාර එල්ල කරන බවට තර්ජනය කරමින්, පසුගිය අඟහරුවාදා ශ්‍රී ලංකාවේ පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ පැවති සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) ව්‍යාපාරයේ උද්ඝෝෂනයක් කඩාකප්පල් කිරීමට පියවර ගත්හ. මෙය දේශපාලන මැර ක්‍රියාවකි. ජවිපෙ මෙම ක්‍රියාව වනාහි ශ්‍රී ලංකා ආන්ඩුව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව වර්ගවාදී යුද්ධය යලි ඇරඹීම ද ජීවන මට්ටම්වලට එරෙහි ආන්ඩුවේ රුදුරු ප්‍රහාරයන් ද සම්බන්ධයෙන් ශිෂ්‍යයන් අතර කිසිදු සාකච්ඡාවක් හා විරුද්ධත්වයක් වර්ධනය වීම වැලැක්වීමේ මංමුලා සහගත ප්‍රයත්නයකි.

සසජාශි සහ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජිකයෝ ශාස්ත්‍ර පීඨයේ පොත් මේසයක් සංවිධානය කොට ඉරාකයේ එක්සත් ජනපද මිලිටරි වාඩිලෑමට හා ශ්‍රී ලංකාවේ යලි ඇරඹුනු සිවිල් යුද්ධයට එරෙහිව උද්ඝෝෂනයක යෙදී සිටියහ. කන්ඩායම දෙමල හා සිංහල භාෂාවලින් මුද්‍රිත පත්‍රිකාවක් බෙදා හරිමින් ලියොන් ට්‍රොට්ස්කිගේ කෘතිවල පරිවර්තන හා *ලෝක සමාජවාදී වෙබ් අඩවි විමර්ශන සඟරාව* ඇතුලු මාක්ස්වාදී සාහිත්‍ය පරාසයක් ප්‍රදර්ශනය කලේ ය.

මධ්‍යම ශ්‍රී ලංකාවේ මහනුවර අසල පිහිටි පේරාදෙනිය විශ්වවිද්‍යාලය, 16,000කට ආසන්න ශිෂ්‍ය ජනගහනයකින් යුක්ත, රටේ කීර්තිමත් ම තෘතීය අධ්‍යාපන ආයතනවලින් එකකි. 1960 ගනන් අග හා 1970 ගනන් මුල, විශේෂයෙන් ම වියට්නාම යුද්ධයට එරෙහි විරෝධතා තුල, දේශපාලන උද්ඝෝෂනවල තෝතැන්නක් වූ මෙම විශ්වවිද්‍යාලය තුල දිගු ඉතිහාසයක් සසපට හා එහි පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයට (විකොස) ඇත. සසජාශි මෙම සතියේ උද්ඝෝෂනය පැවැත්වීම සඳහා ලිඛිත අවසරයක් ඉල්ලා එය ලබා ගෙන තිබුනි.

පොත් මේසය සසජාශි පිලිවෙත් හා ක්‍රියාමාර්ගය පිලිබඳව, දෙමල හා සිංහල ශිෂ්‍යයන් අතර එකසේ සජීවී සාකච්ඡාවක් අවුලුවාලී ය. වෙනත් කිසිදු සංවිධානයක් ඉරාකයේ එක්සත් ජනපද වාඩිලෑමට හා ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයට එරෙහිව සමාජවාදී හා ජාත්‍යන්තරවාදී විකල්පයක් ඉදිරිපත් කරන්නේ නැත. බොහෝ ශිෂ්‍යයෝ මෙම යුද්ධ දෙකට ම පමනක් නොව පොදු අධ්‍යාපනයට වල කැපීමේ ආන්ඩුවේ පියවරවලට ද සතුරු ය. ඔවුන්ගේ උනන්දුව පිලිබඳ එක් දර්ශකයක් වූයේ රුපියල් 3,800ක් වටිනා පොත් අලෙවි වීම යි. මෙය වනාහි බොහෝ අඩු වැටුප් ලබන කම්කරුවකුගේ මාසික වැටුපට සමාන මුදලකි.

සිය අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය (අවිශිබම) යොදා ගනිමින් සිංහල ස්වෝත්තමවාදී දේශපාලනයේ, බියගැන්වීම්වල හා ප්‍රචන්ඩ ක්‍රියාවල එකතුවක් හරහා පසුගිය දශකය තිස්සේ විශ්වවිද්‍යාල ගනනාවක ආධිපත්‍යය පවත්වා ගෙන විත් ඇති ජවිපෙ, සසජාශි සමග දේශපාලන සාකච්ඡාවක නිරත වන ශිෂ්‍යයන්ගේ අනවරත ප්‍රවාහයක් දැකීමෙන් පැහැදිලිව ම කලබලයට පත් විය. ජවිපෙ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ධනපති ආන්ඩුවට සහයෝගය දෙන අතර එල්ටීටීඊයට එරෙහි යුද්ධය තීව්‍ර කරන ලෙස ද ඉල්ලා සිටී. “සමාජවාදී” හෝ “මාක්ස්වාදී” බවට ඔවුන් අතීතයේ කල සාවද්‍ය කියාපෑම් දැන් මුලුමනින් ම පාහේ අතහැර දමා ඇත.

ජවිපෙ සාමාජිකයන් හා ආධාරකරුවෝ සසජාශි මේසය වටා ගැවසෙමින් සිදු වන දෙය නිරීක්ෂනය කරමින් සිටියහ. පසුව පෙරවරු 10.30ට පමන තමන් ක්‍රියාත්මක විය යුතු බවට ඔවුහු තීන්දු කලහ. කන්ඩායමෙන් එක් අයෙක් සසජාශි මේසය වෙත පැමින සමහර පොත්වල පිටු පෙරලා බලා පොත් කිහිපයක් මිලදී ගත්තේ ය. ඔහු සමග සාකච්ඡා කිරීමට සසජාශි සාමාජිකයන් උත්සාහ කල විට, ඔහු විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් ජවිපෙ යොදා ගන්නා සම්මත පිලිවෙත පුනරුච්චාරනය කලේ ය. එනම් තමන් පක්ෂ දේශපාලනය ගැන උනන්දු නැති බවත් “ශිෂ්‍යයන්ට හොඳක් වන දේශපාලනය” ගැන පමනක් උනන්දු බවත් ය. මෙම සූත්‍රය යොදා ගන්නේ. ජවිපෙ දේශපාලන ආධිපත්‍යය පවත්වා ගෙන යාමත් මොන යම් හෝ දේශපාලන විවේචනයක් මැඩීමත් සහතික කර ගැනීමට ය.

නිදහස් අධ්‍යාපනය දිනා ගනු ලැබුවේ ශිෂ්‍යයන් විසින් ඔවුන්ගේ අතීත විරෝධතා හා අරගල හරහා යැයි ජවිපෙ සාමාජිකයෝ ප්‍රකාශ කලහ. එම කියාපෑම යථාර්ථය විකෘත කිරීමක් බව සසප සාමාජිකයෙක් පෙන්වා දුන්නේ ය. ශ්‍රී ලංකාවේ සෙසු සමාජ ජයග්‍රහන ගනනාවක් මෙන් ම, නිදහස් අධ්‍යාපනය ද දිනා ගනු ලැබුවේ 1940 ගනන් හා 1950 ගනන්වල දී ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ -- ඉන්දියානු බෝල්ෂේවික් ලෙනින්වාදී පක්ෂයේ (බිඑල්පීඅයි) හා ලංකා සමසමාජ පක්ෂයේ (ලසසප) -- නායකත්වය යටතේ කම්කරු පන්තිය විසින් බව ඔහු පැවසී ය. ශිෂ්‍යයන් හා තරුන ජනයා මෙම පුලුල් ව්‍යාපාරයේ කොටසක් ලෙස අරගලයේ නිමග්න වී තිබුනි.

සසජාශි ව්‍යාපාරයට දේශපාලනිකව අභියෝග කිරීමෙහිලා අපොහොසත්ව, ජවිපෙ කන්ඩායම වෙනත් ක්‍රමවල පිහිට පැතීමට තීන්දු කලේ ය. පොත් මේසය සංවිධානය කරනු ලැබුවේ කාගේ අධිකාරියක් මත ද යන වග දැන ගැනීමට එක් අයෙකුට අවශ්‍ය විය. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිගේ අවසරය ගැන පැවසූ විට, ජවිපෙ සාමාජිකයා ප්‍රකාශ කර සිටියේ සසජාශි ව්‍යාපාරයට පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීමට මිසක් ශිෂ්‍යයන් අතර “උද්ඝෝෂනය” කිරීමට අවසරයක් නැති බව යි. ශිෂ්‍ය සංගමයේ අවසරයකින් තොරව කිසිවකුට විශ්වවිද්‍යාලයේ කිසිදු කටයුත්තක් සංවිධානය කිරීමට ඉඩ නොදෙන බව ඔහු පැවසී ය.

තථ්‍ය වසයෙන් ගත් කල, එවන් අනුමැතියක් අවශ්‍ය නොවන අතර සසජාශි දින ගනනාවක් තිස්සේ පොත් ප්‍රදර්ශනය ගැන විවෘතව ප්‍රචාරක ව්‍යාපාරයක් ගෙන ගොස් තිබුනි. මෙම හිරිහැරය ගැන ලේඛකාධිකාරිට දැනුම් දීමෙන් පසුව සසජාශි සිය උද්ඝෝෂනය දිගට ම ගෙන ගියේ ය.

දිගින් දිගට ම එල්ල වූ ඝෝෂාකාරී තර්ජන තිබිය දී ම, ශිෂ්‍යයෝ පොත් මේසය වෙත ලඟා වීම දිගට ම සිදු විය. එය මත් අර්ථභාරී විය. එහි ශිෂ්‍ය සාමාජිකයන් ඇතුලුව, ජවිපෙ, පසුගාමිත්වය, තර්ජන හා ප්‍රචන්ඩ ක්‍රියා සම්බන්ධයෙන් කුප්‍රකට ය. 1980 ගනන් අග දී, ජවිපෙ ඝාතක කල්ලි විකොස සාමාජිකයන් තිදෙනෙකු ඇතුලු, දෙමල ජනතාවට හා ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහි ඔවුන්ගේ ස්වෝත්තමවාදී උද්ඝෝෂනයට එකතු වීම ප්‍රතික්ෂේප කල, දේශපාලන විරුද්ධවාදීන්, වෘත්තීය සමිති නායකයන් හා කම්කරුවන් සිය ගනනක් මරා දැමූහ. *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* ශිෂ්‍යයන් පැහැදිලි කල පරිදි, පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ වත්මන් ජවිපෙ ශිෂ්‍ය නායකයන් ප්‍රසිද්ධ වී ඇත්තේ වල් ඌරා හා මෝරා වැනි අනවර්ථ නම්වලිනි.

මෑත සිදුවූ දරුනුම සිද්ධියක් වනුයේ, 2002 නොවැම්බරයේ දී 200කින් පමන සමන්විත ජවිපෙ මැර කල්ලියක් ගල් හා මුගුරුවලින් සන්නද්ධව ජයවර්ධන විශ්වවිද්‍යාලයේ පැවති රැස්වීමකට කඩා වැදී එහි සිටියවුන්ට දරුනු ලෙස පහර දීම යි. තෙවන වසරේ කලමනාකරන සිසුවකු වූ සමන්ත විතානගේට පහර දීමෙන් බිම වැටුනු පසුව ඔහුගේ හිසට පරිගනක මොනිටරයකින් දමා ගසනු ලැබී ය. ඔහු පසුව රෝහලේ දී මිය ගියේ ය. තවත් සිසුන් දහ තුන් දෙනෙකුට බරපතල තුවාල සිදු විය. විතානගේ කල “අපරාධය” වූයේ ජවිපෙ පසුගාමී භාවිතාවක් වන “නවක වදය” ට -- එනම් අශෝභන ක්‍රියාවල යෙදීමට පලමු වසර සිසුන්ට බල කිරීමට -- විරුද්ධව උද්ඝෝෂනය කිරීම යි.

සසජාශි උද්ඝෝෂනය බිඳ දැමීමට අධිෂ්ඨානශීලීව, පොත් මේසය වෙත ලඟා වූ, “මෝරා” නමින් වඩා හොඳින් ප්‍රසිද්ධ ශිෂ්‍ය සංගම් නායක චින්තක තුඩුවගේ, සසජාශි හා සසප සාමාජිකයන් “වහාම අකුලා ගෙන යා” යුතු යැයි මහ හඬින් ප්‍රකාශ කර සිටියේ ය. එසේ නො කල හොත් “තත්වය වඩා නරක” වනු ඇතැයි ඔහු ප්‍රකාශ කලේ ය. ඔහු කරන්නේ තර්ජනයක් ද යන වග ඇසූ කල ඔහු මෙසේ පුරසාරම් දෙඩී යඃ “ඔව්, තර්ජනයක් තමයි. අපට තර්ජනය කරන්න බැරි ද? ඕගොල්ල නොගියොත් අපි ඕගොල්ල බලහත්කාරයෙන් යවනවා.” විශ්වවිද්‍යාලයට එන සසජාශි සාමාජිකයකු තර්ජනාත්මකව නම් කල ඔහු මෙසේ අනතුරු ඇඟවී යඃ “එයා මේ විශ්වවිද්‍යාලයට ආයිත් ආවොත් අපි එයාට ගහනවා.”

ජවිපෙ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවන් හෙලා දකිමින් සසප හා සසජාශි සාමාජිකයෝ ප්‍රතිචාර දැක්වූහ. කෙසේ වෙතත්, සෙසු ශිෂ්‍යයෝ, සිදු වූ දේ ගැන එකඟ නොවුනත් ජවිපෙ අනතුරු ඇඟවීම්වල ප්‍රතිවිපාක ගැන හොඳින් දැනුවත්ව ස්ථානයෙන් ඉවත් වූහ. ප්‍රචන්ඩ ක්‍රියාවන්ගේ තර්ජනයත් උද්ඝෝෂනය යථා වසයෙන් බිඳ දැමීමත් හමුවේ, එය නතර කොට පිටත්ව යාමට සසජාශි හා සසප තීන්දු කලේ ය.

සිද්ධිය ඇසින් දුටු එක් කථිකාචාර්යවරයෙක් පසුව *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* මෙසේ පැවසී යඃ “සසප/සසජාශි පොත් අලෙවිය නතර කරන්න කන්ඩායමක් මැදිහත් වන කොට මම එතන හිටියා. ඔවුන්ගෙන් එක් කෙනෙක් ශිෂ්‍ය සංගමයේ සභාපති ලෙස මම පැහැදිලිව අඳුනා ගත්තා. මම ඔහුගෙ නම දන්නෙ නැහැ. සිදු වූ දේ ගැන මම උත්සුක වෙනවා. මොකද කිව්වොත් ඒක බුද්ධිමය වර්ධනය සඳහා බෙහෙවින් අවශ්‍ය නිදහස් අදහස් හුවමාරුවේ අති මූලික අයිතිය උල්ලංඝනය කිරීමක්.

“මම හිතන්නෙ ඒක බුද්ධිමය සාකච්ඡාවේ හා විවාදයේ තෝතැන්නක් ලෙස විශ්වවිද්‍යාලයේ තත්වය හැල්ලු කිරීමක් කියලා. රැස්ව සිටි ශිෂ්‍යයන්ට මම කිව්වා, විවිධ බුද්ධිමය ධාරා බොහෝ ප්‍රමානයක් සහිත සාහිත්‍යවලින් පිරිච්ච පුස්තකාලයක් ඕගොල්ලන්ට තියෙනවා. ඕගොල්ලන්ට අන්තර් ජාලය තියෙනවා.

මෙම කොන්දේසි යටතේ, චින්තනය පාලනය කිරීමේ මෙම උත්සාහය කිසිම අර්ථයක් නැහැ. ඕගොල්ල අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ආරක්ෂා කල යුතු යි. ඇයි මිනිස්සු අදහස්වලට ඔච්චර බය?"

මොන යම් හෝ දේශපාලන අභියෝගයකට ජවිපෙ බිය වන්නේ ඔවුන්ගේ පිලිවෙත් ශිෂ්‍යයන් හා වැඩ කරන ජනතාව අතර වඩ වඩාත් ජන අප්‍රිය බවට පත්ව තිබෙන බැවිනි. යුද්ධයත් එල්ටීටීඊය මිලිටරිමය ලෙස විනාශ කිරීමත් සඳහා ඔවුන් දෙන සහයෝගය සමග ම, මෙම පක්ෂය රාජපක්ෂගේ මාධ්‍ය මර්දනයට හා නඩු නැතිව රඳවා ගැනීම වැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරවලට සහයෝගය දෙයි. "මව්බිම පලමුව අන් සියල්ල දෙවනුව" යන ධජය යටතේ ජවිපෙ, ජීවන තත්වයන් හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමේ ඕනෑම අරගලයකට, එනම්, යුද ප්‍රයත්නය සමග ගැටෙන ඕනෑම අරගලයකට, විරුද්ධ වී ඇත.

විශ්වවිද්‍යාල තුල, ජවිපෙ නායකයන් සිය පැරනි අධිරාජ්‍ය විරෝධී වාචාල කතා කුනු කූඩයට දමා ඉරාකයේ සාපරාධී එක්සත් ජනපද වාඩිලෑම ගැන මුනිවත රැක ඇත. එක්සත් ජනපද තානාපති නිලධාරින් සමග පුද්ගලික සාකච්ඡා පැවැත්වූ පාර්ලිමේන්තුව තුල සිටින ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨයන් මෙන් ශිෂ්‍ය නායකයෝ ද වොෂිංටනය ශ්‍රී ලංකා ආන්ඩුවේ ව්‍යාජ "ත්‍රස්ත විරෝධී යුද්ධයට" සහයෝගය දෙන තාක් කල් ඉරාකයේ එක්සත් ජනපද යුද්ධයට නිහඬව සහාය දෙති. විශ්වාසනීයත්වයක් ලබා ගැනීමේ උත්සාහයක් ලෙස, ජවිපෙ පොදු අධ්‍යාපනය බලපාන කප්පාදුවලට "විරුද්ධ" වීමේ දෙබිඩි උද්ඝෝෂනයක් ගෙන යන්නේ රාජපක්ෂ ආන්ඩුවේ දැවැන්ත මිලිටරි වියදම් ඉහල දැමීමට මුලුමනින් ම සහාය දෙන අතරතුර ය.

චින්තක තුඩුවගේ හා ඔහුගේ මැර කල්ලිය ක්‍රියාත්මක වන්නේ සෘජුව ම විශ්වවිද්‍යාල තුල රාජපක්ෂ ආන්ඩුවේ දේශපාලනික පොලීසිය ලෙස ය. විශේෂයෙන් ම අනතුරු අඟවන සංඥාවක් ලෙස, ලෝක සමාජවාදී වෙබ් අඩවියට දැන ගන්ට ලැබී ඇත්තේ ශිෂ්‍ය සංගමය සසජාශි සාහිත්‍ය මිලදී ගත් දෙමල සිසුන් බිය ගැන්වීම හා ඔවුන්ට තර්ජනය කිරීම හෝ ඊටත් වඩා දරුනු පියවරක් සඳහා ඔවුන් ගැන සෙවීමේ උත්සාහයක යෙදී සිටින බව යි. සසජාශි සහ සසප මෙම තර්ජනයන්ට නිදැල්ලේ යාමට ඉඩ නොදෙනු ඇත. ජවිපෙ ක්‍රියාවන්ට එරෙහිව ද විශ්වවිද්‍යාල තුල පූර්න හා නිදහස් අදහස් හුවමාරු අයිතිය ආරක්ෂා කර ගැනීමට ද දේශපාලන උද්ඝෝෂනයක් දියත් කෙරෙනු ඇත.

© www.wsws.org